


# නයිට් වොච්මන් කෙනෙකු බේදා දෙන නයිට්වොච්මන් ආශ්වාදය

මැතිව් හොගාර්ඩ් එංගලන්ත ක්‍රිකට් කණ්ඩායමට නැතිවම බැරි වේගපන්දු යවන්නෙක් යයි පැවසීමේ වරදක් නැහැ. එහෙත් මෑතකදී එංගලන්ත සංචාරයක නියැලුනු ඉන්දීය ක්‍රිකට් කණ්ඩායම සමග පැවැති ටෙස්ට් ක්‍රිකට් තරගාවලියේදී ඔහුට එංගලන්ත පිලට එක්වීමට නොහැකි වී තිබුණි.

ඔහු කලක සිට පිටකොන්දේ ආබාධයකින් පෙලුනු අතර ඊට ප්‍රතිකාර ලබා ගනිමින් සිටි නිසා තමයි ඉන්දීය තරගාවලිය හොගාර්ඩ්ට අහිමි වී ගියේ.

ක්‍රිකට් ක්‍රීඩාවේදී දක්ෂ පන්දු යවන්නෙකු ලෙස කැපී පෙනෙන්නට සමත් වෙනව වගේම ක්‍රීඩා පිටියෙන් පිටතදීත් ඔහු කිසියම් නිෂ්පාදනයක් වෙළෙඳපලට හඳුන්වාදීම සඳහා කැපවීමකින් වෙහෙසුන කෙනෙක්. නමුත් අවිවේකී ක්‍රිකට් පිටිය හොගාර්ඩ්ගේ නිෂ්පාදනය වෙළෙඳ පොළට හඳුන්වාදීමේ ක්‍රියාවලිය දවසින් දවස ප්‍රමාද කරනු ලැබුවා.




හොගාර්ඩ් ආබාධයකට ලක්ව ප්‍රතිකාර ලබා ගැනීම සඳහා ක්‍රීඩා පිටියෙන් ඈත් වෙන්නේ ඔය අතරේදියි.

කෙටි කාලයකට වුවත් ක්‍රිකට් පිටියෙන් ඈත්ව සිටීමට සිදුවීම සමහරෙකුට අවාසනාවන්ත සිදුවීමක් ලෙස පෙන්නට පුළුවන්. නමුත් ඔහු ක්‍රිකට් පිටියෙන් ඈත්වීමත් සමග එතෙක් මන්දගාමීව සිදුවෙමින් පැවැති ඔහුගේ නව නිෂ්පාදනයේ පර්යේෂණ කටයුතු සීඝ්‍රගාමී වුණා. ඒ නිසා ක්‍රිකට් ක්‍රීඩාවෙන් ඈත්ව සිටින්නට සිදුවීම ඔහුට අවාසනාව අත්කර දීමක් වූයේ නැහැ.

හොගාර්ඩ් තම නිෂ්පාදනය එළිදැක්වීම සඳහා කරන ලද සියලු පර්යේෂණ සාර්ථක වී තිබුණි. ඔහු මෙතෙක් කාලයක් නියැලී සිටි පරීක්ෂණය වූයේ නවතම බියර් වර්ගයක් වෙළෙඳපොලට හඳුන්වාදීම පිණිසය. තම නිෂ්පාදනය ඉහළම තත්ත්වයක පවතින බව හොගාර්ඩ් පර්යේෂණය සනාථ කර තිබුණි.

මැතිව් හොගාර්ඩ් දක්ෂ පන්දු යවන්නෙක් වුවත් පිතිකරණ හැකියාවද යම් තරමකට හෝ තිබුණු කෙනෙක්. එංගලන්ත පිල කිසියම් තරගයක දිනයක් නිමාවට පත්වීමට පන්දුවාර කිහිපයක් පමණක් තිබියදී ලකුණු රැස්කරමින් සිටින විටක මුල් පෙළ පිතිකරුවකු දැවී ගියහොත් කණ්ඩායමේ සිටින ඉතිරි ප්‍රබල පිතිකරුවන් රැක ගැනීම සඳහා එදින ඉතිරි පන්දුවාර කිහිපයට මුහුණ දීම වැඩි වශයෙන් පැවරෙන්නේ මැතිව් හොගාර්ඩ්ටය.

හොගාර්ඩ්ද එම යුතුකම තමන්ට පැවරුණු බොහෝ අවස්ථාවල එය නිසියාකාරව ඉටු කරන්ටද සමත්ව තිබුණි.

අප ආරක්ෂක පිතිකරු ලෙස හඳුන්වන මේ තනතුර ක්‍රිකට් ක්‍රීඩාවේදී (Night watchman) නයිට්වොච්මන් ලෙස නම්කර ඇත.

කොහොම උනත් මන්දාලෝකය මැද තම කණ්ඩායමේ සිටින හොඳම සොල්දාදුවන් බේරා ගැනීමේ වගකීම සියතට ගෙන පිටිය මැදට පැමිණි හොගාර්ඩ් බොහෝ අවස්ථාවල ඒ යුතුකම ඉටුකර ඇත්තේය.

ඇත්තෙන්ම එවැනි භාරදූර වගකීමක් ඉටුකොට අපරාජිතව ක්‍රීඩාගාරයට ගිය හැමවිටකම මැතිව් හොගාර්ඩ් විඳ ඇත්තේ අපමණ ආශ්වාදයකි. එහෙත් එවැනි ආශ්වාදයක් විඳීමේ වාසනාව හැම ක්‍රිකට් ක්‍රීඩකයෙකුටම ලැබෙන්නේ නැත. එසේ වුවද නයිට් වොච්මන් කෙනෙකුට ලබාගත හැකි ඒ මහඟු ආශ්වාදය නයිට් වොච්මන් කෙනෙකු නොවන අයෙකුටද දැන් ලබාගත හැකි වන මැතිව් හොගාර්ඩ් සිය නිෂ්පාදනය වෙළෙඳ පොලට හඳුන්වා දෙන දිනයේ ප්‍රකාශ කර ඇත.

ඔහු ඒ සඳහා දී තිබෙන උපදේශය වූයේ ක්‍රිකට් තරගයක් නතර කළ පසු ක්‍රීඩාගාරයට ගොස් තමන් නිපදවූ බියර් බෝතලයක් පානය කරන ලෙසය.

මේ නිසා මැතිව් හොගාර්ඩ් තමන් නිපදවූ බියර් විශේෂය "Nightwarchman Beer" යනුවෙන් නම් කර ඇත.

## සිරමැදුරෙන් සිරිමැදුරට දොර හැර දුන් බොක්සිං ප්‍රහාරය

**මෑදු** මොලොක් බව නිතැතින්ම කාන්තාවන්ට උරුම වන ලක්‍ෂණයක්ය, යන මතය පුරාණයේ සිටම සමාජ ගතව තිබෙන්නකි. එම මතය තවදුරටත් වර්තමාන සමාජයට ගැලපේදැයි යන ප්‍රශ්නය මතු කරන සාධක දැන් දැන් ක්‍රීඩා පිටියෙන්ද පැන නගිමින් පවතින බව පෙනෙන්නට ඇත.




කරාතේ, බොක්සිං, වුෂු, කික් බොක්සිං ආදී සටන්කාමී බව හා බැඳුනු ක්‍රීඩාවන්ට මීට කලකට ඉහත දී කාන්තාවගේ සම්බන්ධවීමක් දක්නට නොවුවද අද එම තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වී අවසන්ය.
සටන් කලාව ආශ්‍රිත ක්‍රීඩාවන්ට යොවන ක්‍රීඩිකාවන්ගේ සංඛ්‍යාව ප්‍රමාණාත්මකව අද ඉහළ ගොසිනි. ආසියානු කලාපය දෙස බලන විට විශේෂයෙන්ම ඊට වැඩි නැඹුරුවීමක් පෙන්වා ඇත්තේ තායිලන්තයයි.

මේ නිසා සිරිපොක් නම් වූ සුන්දර ලලනාව තුළ පිරිමියෙකුගේ හැඩි දැඩි බවද සැඟව තිබූ බව බොහෝදෙනෙකු හඳුනා ගත්තේ කලක් ඇවෑමෙනි.

කෙසේ වුවත් ඇය පළමුවරට කාන්තා ලයිට් වේට් බොක්සිං කිරුළ දිනාගෙන ඇත්තේ සිරකාරියක ලෙස බැංකොක් හී අධි ආරක්ෂිත කලාපයේ පිහිටි ප්‍රෙම් බන්ධනාගාරයේ සිරගතව සිටි සිරකාරියක ලෙසිනි.

මත්ද්‍රව්‍ය වෙළෙඳාමේ නියැලී සිටි ඇයට සුළු මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් ලග තබාගෙන සිටියදී නීතියට කොටුවී වසර 10 ක සිර දඬුවමකට යටත්විමට සිදුව තිබුණි.

සිරමැදිරි ඉදිවන්නේ අහිංසකයින් රඳවා තබන්නට නොව සමාජ විරෝධී ක්‍රියාවන් හි නියැලෙන්නන් වෙනුවෙනි. එබැවින්

කොහොම නමුත් ලිංග බේදයකින් තොරව තායිලන්ත ජාතිකයින් වෙත සටන්කාමී බව උපතින්ම පිහිටා ඇති බවක් දක්නට ඇත. කික් බොක්සිං තරග නැරඹීමට එරට තරුණියන් තුළ ඇත්තේ නොසන් සිදෙන ආශාවකි.

ඒ හැර ඔලිම්පික් ක්‍රීඩා උළෙලකදී තායිලන්තයට පළමු රන් පදක්කම ලැබී ඇත්තේද බොක්සිං ක්‍රීඩාවෙන් බැවින් එය ඔවුන් තුළ සටනට ඇති කැමැත්ත හුවා දක්වන නිදසුනක් වැනිය.

පසුගියදා ලෝක බොක්සිං සමුළුව සංවිධානය කළ කාන්තා ලයිට් ෆ්ලයිවේට් බොක්සිං තරගයේදී ජපාන ක්‍රීඩිකාවක වූ අන්රි නකගාවා පරාජය කොට තායිලන්තයෙන් ඉදිරිපත් වූ සිරිපොන් තවිසුක් පසුගිය අප්‍රේල් මාසයේ ඇය විසින් දිනාගත් කාන්තා ලයිට් වේට් බොක්සිං ශූරතාව තවදුරටත් රැක ගන්නට සමත් වූවාය.

සිරිපොක් තම්සුක්ගේ බාහිර පෙනුමින් ඇය මෑදු මොලොක් සොඳුරු යුවතියකි. නමුත් මත්ද්‍රව්‍ය වෙළෙඳාම සිය ජීවන වෘත්තිය බවට පත් කරගෙන ජීවත් වූ ඈ වඩාත්ම ප්‍රිය කළේ බොක්සිං ක්‍රීඩාවටය.

සිරගෙදර පිරිමියාට මෙන්ම කාන්තාවටද විවෘතය.

සිරගෙදරදී ශූප ශාස්ත්‍රය, කොණ්ඩ සැරසිලි කලාව හා විද්‍යානුකූල ඇඳුම් නිර්මාණ පාඨමාලාවද හොඳින් ප්‍රගුණ කරන්නට සිරිපොක් සමත් වූවාය. එහෙත් සිරගෙදර දී ඇයට හමුවන්නේ නොහික්මුණු ආවේගශීලී තමන් වැනිම කාන්තාවන් පිරිසක් බැවින් ඉඳහිට හෝ ඔවුන්ගෙන් එල්ල වන තර්ජනවලට මුහුණදීම සඳහා පළමු වසර 3 ගෙවී යද්දී බොක්සිං ක්‍රීඩාවට යොමු වීමටද ඇය තීරණය කර තිබුණි.

සිරිපොක් තවිසුක් බොක්සිං ක්‍රීඩාවටද බොක්සිං ක්‍රීඩාවට සිරිපොක් ද හොඳින් ගැලපුණාය. ඒ අනුව අති දක්ෂ බොක්සිං ක්‍රීඩිකාවක ලෙස ඉතා කෙටි කලකදී ඉදිරියට එන්නට ඇය සමත් වූවාය.

පසුගිය අප්‍රේල් මාසය වනවිට ලෝක බොක්සිං සමුළුවේ ලයිට් ෆ්ලයිවේට් කාන්තා කිරුළ හිස්ව පැවති අතර, සිරගෙදර සිටම ඇය එම කිරුළ දිනා ගැනීම සඳහා ඉදිරිපත් වී තිබුණි.

28 වන පිටට

## තේරවිල්ල

*තදින් ගමන් යන විදුර සෙ දිව ඇත කන්දක් දුටු තැන    බිඳ කන්නේ*
*ඔළුවෙ අඟක් ඇත අත් පා නෙත් නැත බඩෙන්ම නිතරම    ඇවිදින්නේ*
*නිතර කෑම කත බඩ පිරෙන්නෙ නැත වමාරලාමයි    උඟ කන්නේ*
*සතර ඉගෙන ගත් පඬිවරු ඇත්නම් තෝරා දෙනු මැන    මේ සන්නේ*

තේරුම 33 වන පිටුවේ